සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020

# 50 - නාට්‍ය හා රංග කලාව

### ලකුණු දීමේ පටිපාටිය





Department of Examinations - Sri Lanka

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

## 50 - නාට්‍ය හා රංග කලාව

### ලකුණු බෙදීයාම

**I පත්‍රය**

**ලකුණු 1 X 40 = 40 කි.**

**II පත්‍රය**

II පත්‍රය ප්‍රශ්න 07 කි. 01 වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතිරි ප්‍රශ්න 06 යෙන් 04 ක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

01 ප්‍රශ්නයට ලකුණු 12 කි.

* තෝරාගන්නා ඉතිරි ප්‍රශ්න 04 කට ලකුණු 12 X 04 = 48 කි.

02 ප්‍රශ්නයට ලකුණු 12 කි.
03 ප්‍රශ්නයට ලකුණු 12 කි.
04 ප්‍රශ්නයට ලකුණු 12 කි.
05 ප්‍රශ්නයට ලකුණු 12 කි.
06 ප්‍රශ්නයට ලකුණු 12 කි.
07 ප්‍රශ්නයට ලකුණු 12 කි.

} ඕනෑ ම ප්‍රශ්න 04 ට ලකුණු 48 කි.

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | 40 |
| II පත්‍රයට ලකුණු | 60 |
| **මුළු ලකුණු** | **100** |

Department of Examinations - Sri Lanka

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) .............................................................. √ △ 4/5

(ii) .............................................................. √ △ 3/5

(iii) .............................................................. √ △ 3/5

(03) එකතුව → □ 10/15

Department of Examinations - Sri Lanka

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

Department of Examinations - Sri Lanka

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

# 50 - නාට්‍ය හා රංග කලාව

## <u>I පත්‍රය - අභිමතාර්ථ</u>

නිපුණතාපාදක විෂය මාලාව අනුව සියලු ම නිපුණතා ආවරණය වන සේ ප්‍රශ්න අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න සකසා ඇත. එය පහත සඳහන් පරිදි වේ.

- ❖ ප්‍රශ්න අංක 01 සිට 04 දක්වා ප්‍රශ්න සිවුවන හා පස්වන නිපුණතා ආවරණය වන පරිදි සකසා ඇත.
- ❖ ප්‍රශ්න අංක 05 සිට 16 දක්වා ප්‍රශ්න පළමුවන, දෙවන, තෙවන හා සිවුවන නිපුණතා ආවරණය වන පරිදි ද,
- ❖ ප්‍රශ්න අංක 17 සිට 23 දක්වා ප්‍රශ්න දෙවන හා තෙවන නිපුණතා ආවරණය වන පරිදි ද,
- ❖ ප්‍රශ්න අංක 24 සිට 29 දක්වා ප්‍රශ්න සිවුවන නිපුණතාව යටතේ ද,
- ❖ ප්‍රශ්න අංක 30 - පළමුවන නිපුණතාව යටතේ ද,
- ❖ ප්‍රශ්න අංක 31 - 40 දක්වා ප්‍රශ්න තෙවන සිවුවන හා පස්වන නිපුණතා යටතේ ද සකස් කර ඇත.

Department of Examinations - Sri Lanka

## <u>I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්</u>

- ❖ ප්‍රශ්න සංඛ්‍යාව 40 කි.
- ❖ එක් එක් ප්‍රශ්නයේ ඇති (1),(2),(3),(4) වරණ 4 අතුරින් නිවැරදි හෝ වඩාත් උචිත හෝ පිළිතුරේ අංකයට සැසඳෙන කවය (x) සලකුණු කර ඇත්නම් 01 ලකුණක් දෙන්න.
- ❖ එක් වරණයකට 01 බැගින් ප්‍රශ්න 40ට ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව (01 x 40) = **40** කි.

## II පත්‍රය - අභිමතාර්ථ

- ❖ ප්‍රශ්න අංක 01 අදාළ නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන් සකස් කර ඇත. එය කොටස් හයකින් සමන්විත වේ. දැනුම, ආකල්ප සහ කුශලතා මැනෙන පරිදි ප්‍රශ්නයේ කඳට අදාළ ව මෙම අනුකොටස් සකස් කර ඇත.
- ❖ දෙවන තෙවන හා පස්වන නිපුණතාව ආවරණය වන පරිදි 02 ප්‍රශ්නය සකස් කර ඇත.
- ❖ සිව්වන නිපුණතාව ආවරණය වන පරිදි 03 ප්‍රශ්නය සකස් කර ඇත.
- ❖ ප්‍රශ්න අංක 04 සහ 05 ප්‍රශ්න දෙවන තෙවන හා පස්වන නිපුණතා ආවරණය වන පරිදි සකස් කර ඇත.
- ❖ ප්‍රශ්න අංක 06 සිවුවන නිපුණතාව ආවරණය වන පරිදි සකස්කර ඇත.
- ❖ ප්‍රශ්න අංක 07 තෙවන නිපුණතාව ආවරණය වන පරිදි සකස් කර ඇත. ශිෂ්‍යයාගේ පරිකල්පනය හා නිර්මාණශීලි රචනා හැකියාව මෙමගින් අපේක්ෂා කෙරේ.

- ❖ එක් ප්‍රශ්නයට ලකුණු 12 බැගින් ප්‍රශ්න 05කට හිමි ලකුණු 12 x 5 = 60

Department of Examinations - Sri Lanka

## II පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

ප්‍රශ්න 07 කින් යුක්ත ය. එයින් පළමු වැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර අනෙක් ප්‍රශ්න 06 න් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

- ❖ පළමුවැනි ප්‍රශ්නය කොටස් 06 කින් යුක්ත ය. සෑම කොටසකට ම ලකුණු 02 බැගිනි.
- ❖ දෙවන ප්‍රශ්නයේ සිට හය වන ප්‍රශ්නය දක්වා (I),(II),(III) වශයෙන් කොටස් 03 කින් යුක්ත ය.
- ❖ දෙවන ප්‍රශ්නයේ සිට හයවන ප්‍රශ්නය දක්වා එක් එක් කොටසට හිමි ලකුණු සංඛ්‍යාව පිළිවෙලින් 02, 04, 06 වශයෙනි. ප්‍රශ්නයකට හිමි සම්පූර්ණ ලකුණු සංඛ්‍යාව 12 කි.
- ❖ ප්‍රශ්නයකට එක් එක් කොටස සඳහා වෙන් කොට ඇති ලකුණු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන අපේක්ෂකයා සපයා ඇති පිළිතුරට අනුව ලකුණු සංඛ්‍යාව තීරණය කළ යුතු ය.
- ❖ සම්පූර්ණ ලකුණු පිරිනැමීම සඳහා පිළිතුරට අපේක්ෂිත කරුණු සියල්ල ම ඇතුළත් විය යුතු ය.
- ❖ පිළිතුරු සංඛ්‍යාව 05කට වැඩියෙන් ලියා ඇති කල්හි අමතර පිළිතුරුවලින් ලකුණු අඩුවෙන් ලබා ඇති පිළිතුරු ඉවත් කිරීම සුදුසු ය.
- ❖ හත්වන ප්‍රශ්නය ඇගයීමට ලක් කිරීමේ දී අංශ තුනකට අදාළ ව සලකා ලකුණු කිරීම කළ යුතු ය. එක් එක් අංශය සඳහා ලකුණු 04 බැගිනි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

Department of Examinations - Sri Lanka

● පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ඇසුරෙන් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A
රජුන් අණ විලසට – මුදලිඳු බසින් සහතුට
ආරච්චි මෙ සබෙට – ඒය විසිතුරු බලනු කදිමට

B
පයින් ඇවිදිල්ල මහන්සිද මන්ද
ගොඩින් පැනගත්ත හුඟක් ළඟ හින්ද
මෙහෙත් හරි වැස්ස එහෙත් හෙම වෙන්නැ
අපොයි හරි වැස්ස වෙලත් උතුරන්න

C
හත් දවසක් තව බෙහෙත් කිරන්නේ
පුරාම අවුරුදු දෙකක් කිරන්නේ
කිරා බරට ජයපාල ද ගන්නේ
ලෙඩාට ඉස්සර වෙදා මැරෙන්නේ

D
ඔබ ප්‍රිය සැමියා මාව මරන්නට තැත්කළ සන්දා – තැත්කළ සන්දා
සිය පණ ගලවා ගන්නට මැරුවා නැ මගේ දෝසා – නැ මගේ දෝසා

E
ගෙයි පාන නැ ගියෝතින් – මම අන්ධකාරෙ ඉන්නෙමි
මා බැන්ද පෙම්බරාගේ – ඒ වාසෙ මාගෙ වාසෙ
බෝ චණ්ඩ ව්‍යාඝ්‍ර ආදී – උන්නත් හිමාල දේසේ
එම් ස්වාමි එක්ක නික්මී – ඒ ජීවිතේට පේවී

**1.** උඩරට ගැමි නාට්‍යයකට අයත් කවියකි.
(1) A (2) B (3) C (4) E

**2.** කෝලම් නාටක ගීතයක් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**3.** නූර්ති ගී ඛණ්ඩයක් වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**4.** දයානන්ද ගුණවර්ධනගේ නාට්‍යයක ඇතුළත් ගීතයකි.
(1) A (2) B (3) C (4) D

5. සතර අභිනය පිළිබඳ මුලින් ම සඳහන් කෘතියේ කර්තෘ වන්නේ,
(1) ඇරිස්ටෝටල් ය. (2) භරතමුනි ය. (3) ධනංජය ය. (4) විශ්වනාථ ය.

6. අංග රචනයේ දී රේඛා ඇඳීමට හා හැඩතල මතු කිරීමට යොදා ගන්නේ,
(1) මේකප් පෙන්සිල් ය. (2) රූජ් ය.
(3) ග්‍රීස් පේන්ට් ය. (4) පවුඩර් ය.

7. නළුවකුගේ රූපණ කාර්යයෙහි මූලික වන්නකි.
(1) රූමත් බව සහ පෞරුෂය (2) අංග රචනය සහ බාහිර පෙනුම
(3) ගායන හැකියාව සහ රූමත් බව (4) කටහඬ සහ පෞරුෂය

8. නෘත්‍යය සඳහා නිදසුනකි.
(1) ලී කෙළි (2) භරත නැටුම් (3) ඔපෙරා (4) වෙස් නැටුම

9. රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණයකි.
(1) නළු-නිළියන්ට විවේක ගැනීමට කාමරයක් තිබීම
(2) ප්‍රධාන තිරය සහ පැති තිරවලින් ආවරණය කර තිබීම
(3) ආලෝකය සැපයීමට අවශ්‍ය විදුලිය පහන් සවිකර තිබීම
(4) ප්‍රේක්ෂක පිරිසකට පහසුවෙන් නැරඹීමට හැකි වන සේ පිහිටා තිබීම

10. නාට්‍ය උපකරණ නිර්මාණය කළ යුත්තේ,
(1) වේදිකා පරිපාලකට ඔසවාගෙන යා හැකි පරිදි ය.
(2) නාට්‍ය ශෛලිය හා අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි ය.
(3) කල් පවතින සැහැල්ලු අමුද්‍රව්‍යවලින් පමණකි.
(4) ලෝකධර්මී නාට්‍ය සඳහා පමණකි.

11. නාට්‍ය පෙළක නළුවන් සඳහා සපයනු ලබන උපදෙස් වන්නේ,
(1) පෙළ මතක් කර දීමයි. (2) විස්තර කථනයයි. (3) රංග විධානයයි. (4) රංග රචනයයි.

12. 'දොරකඩ අස්න' නම් අවස්ථාව ඇත්තේ කුමන බෞද්ධ පූජාකර්මය අවසානයේ ද?
(1) මිලින්ද ප්‍රශ්නය (2) සති පිරිත (3) සූවිසි විවරණය (4) ආසන දෙකේ බණ

13. පහත සඳහන් නළුවන් අතරින් කදා වළලු නාට්‍යයේ 'කච්ඡපුට' චරිතය නිරූපණය කළේ,
(1) ශ්‍රියන්ත මෙන්ඩිස් ය. (2) බෙන් සිරිමාන්නය.
(3) ජයලත් මනෝරත්න ය. (4) එඩ්මන්ඩ් විජේසිංහ ය.

14. නාඩගම් සඳහා භාවිත වන සංගීත භාණ්ඩයක් වන්නේ,
(1) හොරණෑවයි. (2) ඩෝලයයි. (3) සර්පිනාවයි. (4) තබ්ලාවයි.

15. දේශානුරාගය තේමා කරගත් නාට්‍ය අඩංගු සම්ප්‍රදාය වන්නේ,
(1) සොකරි ය. (2) කෝලම් ය. (3) නාඩගම් ය. (4) නූර්ති ය.

16. නූතන සිංහල නාට්‍ය කලාවේ සන්ධිස්ථානය සනිටුහන් වන්නේ කවර නාට්‍යය බිහිවීමෙන් පසුව ද?
(1) කුවේණි (2) මනමේ (3) සුභ සහ යස (4) සිංහලේ නාඩගම

● පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය | මෙරට නිෂ්පාදක/පරිවර්තක |
|---|---|---|---|
| A | ප්ලෝටස් | කඹය | බන්දුල ජයවර්ධන |
| ද ඩ්‍රැගන් | B | මකරාක්ෂයා | සිරිල් සී. පෙරේරා |
| කැට් ඔන් ද හොට් ටින් රූෆ් | ටෙනසී විලියම්ස් | C | සුගතපාල ද සිල්වා |
| ලේඩි ෆ්‍රොම් ද සී | හෙන්රික් ඉබ්සන් | සයුරෙන් ආළඳ | D |

17. ඉහත වගුවේ A කොටුවට ඇතුළත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) රූඩන්ස් (2) ද ග්ලාස් මෙනාජරි (3) ද පබ්ලික් එනිමි (4) යෙර්මා

18. ඉහත වගුවේ B කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක් ද?
(1) නිකලොයි ගොගොල් (2) ගාර්ෂියා ලෝර්කා (3) එව්ගිනි ශ්වාත්ස් (4) ටෙනසී විලියම්ස්

Department of Examinations - Sri Lanka

**19.** ඉහත වගුවේ C කොටුවට අයත් මෙරට පරිවර්තනය කුමක් ද?
(1) වෙස් මුහුණු (2) අහස් මාළිගා
(3) පුත්‍ර සමාගම (4) හෙලේ නැග්ග ඩෝං පුත්‍රා

**20.** ඉහත වගුවේ D කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක/පරිවර්තක කවුරුන් ද?
(1) විජිත ගුණරත්න (2) සුනන්ද මහේන්ද්‍ර
(3) ගුණසේන ගලප්පත්ති (4) ප්‍රසන්න විතානගේ


**21.** 'නිර්මිත චලන' යනු නළුවා
(1) පෙර පුහුණුවීම්වලින් ඉගෙනගන්නා රංග කාර්යයකි.
(2) පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන්නකි.
(3) රංග ක්‍රීඩා මගින් පුහුණු කරනු ලබන ක්‍රියාකාරකමකි.
(4) නිශ්චිත රටාවකට අනුව කරන රිද්මයානුකූල ක්‍රියාවකි.

**22.** නළුවකු රංග කාර්යයේ යෙදෙන අවස්ථාවේ දී ඔහු වඩාත් අවධානය යොමු කළ යුත්තේ,
(1) රංග වස්ත්‍ර නිර්මාණ ශිල්පියා කෙරෙහි ය. (2) වේෂ නිරූපණ ශිල්පියා කෙරෙහි ය.
(3) රංගාලෝක ශිල්පියා කෙරෙහි ය. (4) පෙළ මතක් කර දෙන්නා කෙරෙහි ය.

**23.** නාට්‍ය සඳහා සංගීතය හා නැටුම් යොදාගනු ලබන්නේ,
(1) චරිත හා සිද්ධි නිරූපණයට උපකාර වන බැවිනි.
(2) ප්‍රේක්ෂක ජනාදරය දිනාගැනීම සඳහා ය.
(3) නළු-නිළියන්ගේ කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා ය.
(4) පාත්‍ර වර්ගයාට වේදිකාවට පැමිණීම හා පිටවීම සඳහා පමණි.

**24.** මංගර දෙවියන් පුද ලබන ශාන්තිකර්මය වන්නේ,
(1) ගම්මඩු ය. (2) පහන් මඩු ය. (3) දෙවොල් මඩු ය. (4) පූනා මඩු ය.

● පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **25** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A B C D E

**25.** වීදි නාට්‍ය රංගනයට දිගු කාලීනව සම්බන්ධව සිටියේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

**26.** 'ඉග්නෙච්වා ඉ' සිංහලට අනුවර්තනය කොට අධ්‍යක්ෂණය කළේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

**27.** කැළණි පාලම නාට්‍යය හා සම්බන්ධ වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**28.** ජන කරළිය හා ටෙලිනාට්‍යයට සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**29.** රංග ක්‍රීඩා මගින්
(1) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වේ. (2) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය පහසු කෙරේ.
(3) අනුකරණ හැකියාව වර්ධනය කළ හැකි ය. (4) නිර්මාණාත්මක සිදුවීම් ගොඩ නැංවිය හැකි ය.

**30.** රූපණය සම්බන්ධ ව ගැඹුරින් අර්ථකථනයක් කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) කොන්ස්ටන්ටින් ස්ටැනිස්ලාව්ස්කි ය. (2) ඇන්ටන් චෙකොව් ය.
(3) ඉයුජින් අයනෙස්කෝ ය. (4) මැක්සිම් ගෝර්කි ය.

Department of Examinations - Sri Lanka

● පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් අංක **31** සහ **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**A**



**B**

**31.** A සහ B වෙස් මුහුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) A සන්නි මුහුණක් වන අතර, B කෝලම් මුහුණකි.
(2) A කෝලම් මුහුණක් වන අතර, B සන්නි මුහුණකි.
(3) A සහ B දෙකම සන්නි මුහුණු දෙකකි.
(4) A සහ B දෙකම කෝලම් මුහුණු දෙකකි.

**32.** B වෙස් මුහුණ
(1) ජසයා ගේ බිරිඳ ගේ මුහුණයි. (2) ආඬිගුරු ගේ බිරිඳ ගේ මුහුණයි.
(3) අඬබෙරකරු ගේ බිරිඳ ගේ මුහුණයි. (4) සූනියම් යක්ෂිණිය ගේ මුහුණයි.

**33.** වේදිකාවේ තබා ඇති පින්තූරයක් පමණක් ආලෝකමත් කිරීමට යොදාගන්නා පහන් වර්ගය කුමක් ද?
(1) යොමු පහන් (2) ධාරාලෝක පහන්
(3) අල්ට්‍රා වයලට් පහන් (4) ස්ට්‍රිප් පහන්

**34.** නළුවකුට කටහඬ හා වචන උච්චාරණය පුහුණුව සඳහා වඩාත් ම යෝග්‍ය ග්‍රන්ථය වන්නේ,
(1) මගුල් ලකුණයි. (2) මහාවංසයයි. (3) ගණදෙවි හෑල්ලයි. (4) බුද්ධ ගජ්ජයයි.

**35.** රට යකුම ශාන්තිකර්මයේ අතුරු රංග අවස්ථාවක් වන්නේ,
(1) නානු මුරයයි. (2) අඹ විදමනයි. (3) රාම මැරීමයි. (4) වැද්දන් ගිවිස්සීමයි.

**36.** 'සිංහල ගැමි නාටකය' ග්‍රන්ථයේ කර්තෘ වන්නේ,
(1) එදිරිවීර සරච්චන්ද්‍ර ය. (2) එම්.එච්. ගුණතිලක ය.
(3) තිස්ස කාරියවසම් ය. (4) ගණනාථ ඔබේසේකර ය.

**37.** නාඩගම් සඳහා භාවිත කළ පහන් විශේෂය වන්නේ,
(1) ධාරා පහන් ය. (2) යොමු පහන් ය.
(3) කිට්සන් පහන් ය. (4) සාමාන්‍ය විදුලි පහන් ය.

**38.** නාට්‍යයක රංග රචනයේ දී වඩාත් ම සැලකිලිමත් විය යුත්තේ කුමක් පිළිබඳ ව ද?
(1) නාට්‍යයේ දෙබස් (2) නාට්‍යයේ කතා පුවත
(3) දර්ශන තල වෙනස් කිරීම (4) වේදිකාවේ සමබරතාව

**39.** ටවර් රඟහලෙහි මුලින් ම ඉදිරිපත් කරන ලද නාට්‍ය වර්ගය වූයේ,
(1) නාඩගම් ය. (2) නූර්ති ය. (3) ටීටර් ය. (4) මිනර්වා ය.

**40.** ප්‍රකට නිළියක වූ රුක්මනී දේවී සිනමාවට පිවිසීමට පෙර රංගනයෙන් දායක වූ නාට්‍ය ප්‍රභේදය වන්නේ,
(1) නාඩගම් ය. (2) නූර්ති ය. (3) මිනර්වා ය. (4) ටීටර් ය.

* *

Department of Examinations - Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020**
**க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2020**

| විෂය අංකය<br>பாட இலக்கம் | **50** | විෂයය<br>பாடம் | **නාට්‍ය හා රංග කලාව** |
|---|---|---|---|

**I පත්‍රය - පිළිතුරු**
**I பத்திரம் - விடைகள்**

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 03 | 11. | 03 | 21. | 02 | 31. | 04 |
| 02. | 01 | 12. | 02 | 22. | 04 | 32. | 03 |
| 03. | 04 | 13. | 03 | 23. | 01 | 33. | 01 |
| 04. | 02 | 14. | 01 | 24. | 04 | 34. | 04 |
| 05. | 02 | 15. | 04 | 25. | 04 | 35. | 01 |
| 06. | 01 | 16. | 02 | 26. | 02 | 36. | 01 |
| 07. | 04 | 17. | 01 | 27. | 02 | 37. | 03 |
| 08. | 02 | 18. | 03 | 28. | 01 | 38. | 04 |
| 09. | 04 | 19. | 04 | 29. | 01 | 39. | 02 |
| 10. | 02 | 20. | 02 | 30. | 01 | 40. | 03 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |
|---|---|---|---|



Department of Examinations - Sri Lanka

# 50 - නාට්‍ය හා රංග කලාව

## II පත්‍රය - පිළිතුරු

1. **දික්තල කාලගෝල** නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) දික්තල කාලගෝල නාට්‍යය අයත් සම්ප්‍රදාය සහ ශෛලිය නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) දික්තල කාලගෝල නාට්‍යයේ ප්‍රධාන ගැටුමට හේතු වන, කාලගෝල හා දික්තල අතර ඇතිවන නොගැළපීම කුමක් ද? (ලකුණු 02 යි)
   (iii) පහත සඳහන් වචනවල සරල අරුත ලියන්න.
   (අ) අමිත්තිරියක් (ආ) සිරිපිල්ලන් (ලකුණු 02 යි)
   (iv) දික්තල ගේ මව සහ පියා ගේ නම් මොනවා ද? (ලකුණු 02 යි)
   (v) මෙම නාට්‍යයේ පූර්ව රංගය හැර ප්‍රධාන කතා පුවතට අයත් චරිත සංඛ්‍යාව කීය ද? (ලකුණු 02 යි)
   (vi) මහෞෂධ පඬිතුමා කාලගෝල ප්‍රශ්නය විසඳීමට අනුගමනය කළ උපක්‍රමය කුමක් ද? (ලකුණු 02 යි)

(i) නාඩගම් සම්ප්‍රදාය
නාට්‍යධර්මී ශෛලිය

*(ලකුණු 02යි)*

(ii) කාලගෝල කලු හා මිටි පුද්ගලයකු වීමත්
දික්තල රූමත් උස ස්ත්‍රියක වීමත්

*(ලකුණු 02යි)*

(iii) අමිත්තිරියක් - නරක හිතක්, අහිතක්, වැරදි විදිහකින් හිතන්න එපා වැනි තේරුම ගෙන දේ
සිරිපිල්ලන් - මාළු

*(ලකුණු 02යි)*

(iv) දික්තල ගේ මව - දික්සුරඹි
පියා - හේතුපානි

*(ලකුණු 02යි)*

(v) චරිත 5යි.

*(ලකුණු 02යි)*

(vi) කාලගෝල, දික්පිටියා සහ දික්තල වෙන වෙන ම කැඳවා ඔවුන් ගේ නම් සහ ඔවුන් ගේ මවුපියන් ගේ නම් මොනවා දැ යි විමසාබැලීම/ ප්‍රශ්න කිරීම

*(ලකුණු 02යි)*

2. (i) නාට්‍යයක සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට සෘජු ව වගකියන පුද්ගලයා කවරෙක් ද? (ලකුණු 02 යි)
   (ii) ඔහු නාට්‍ය පෙළක් තෝරාගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද? (ලකුණු 04 යි)
   (iii) නාට්‍ය පෙළ රංගයක් බවට පත්කිරීමේ දී ඊට දායක වන ආනුෂංගික ශිල්පීන් නම් කර, ඔවුන් **දෙදෙනකු** ගේ කාර්යභාරය විමසන්න. (ලකුණු 06 යි)

(i) නාට්‍ය අධ්‍යක්ෂකවරයා/ නිෂ්පාදක

*(ලකුණු 02යි)*

Department of Examinations - Sri Lanka

(ii) අධ්‍යක්ෂ නාට්‍ය පෙළක් තෝරාගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- තේමාව හා දෘෂ්ටිය/ අන්තර්ගත අදහස්
- නාට්‍යයේ ශෛලිය හා සම්ප්‍රදාය/ නාට්‍ය ප්‍රභේදය
- චරිත වර්ග හා චරිතවල ස්වභාවය
- නාට්‍යයේ ගැටුම් අවස්ථා
- මූල්‍යමය හැකියාව
- කතා වස්තුවේ ප්‍රබලත්වය
- සංවාදවල අර්ථවත්බව හා ජීව ගුණය
- චරිත නිරූපණයේ සාර්ථකත්වය
- රංගෝචිත බව
- තමාට නිර්මාණය කරගැනීමට ඇති හැකියාව
- නව අර්ථකථන මතු කළ හැකි ද යන්න
- ඉලක්කගත ප්‍රේක්ෂක පිරිස

මෙවැනි කරුණු 4ක් ලියා ඇත්නම් ***(ලකුණු 04යි)***

(iii) නාට්‍ය පෙළ රංගයක් බවට පත් කිරීමේ දී ඊට දායක වන ආනුෂංගික ශිල්පීන් වන්නේ,

- අංග රචනා ශිල්පියා
- නාට්‍යෝපකරණ නිර්මාණ ශිල්පියා
- වේෂභූෂණ නිර්මාණ ශිල්පියා
- වේදිකා පසුතල නිර්මාණ ශිල්පියා/ රංගභූමි අලංකරණ ශිල්පියා
- රංගාලෝක ශිල්පියා
- රංග වින්‍යාස නිර්මාණ ශිල්පියා
- සංගීත නිර්මාණ ශිල්පියා

ආනුෂංගික ශිල්පීන් 4 දෙනෙකු නම් කිරීමට ලකුණු 02යි.
ආනුෂංගික ශිල්පීන් දෙදෙනෙකු ගේ කාර්යභාරය විමසීමට ලකුණු 04යි.

***(මුළු ලකුණු 2 + 4 = 6යි)***

Department of Examinations - Sri Lanka

**3.** (i) කොහොඹා කංකාරිය ශාන්තිකර්මය පැවැත්වීමේ මූලික අරමුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) මෙම ශාන්තිකර්මයේ අතුරු රංග අවස්ථා **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ සංවාද භාවිත වන ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i)
- සශ්‍රීකත්වය හා සෞභාග්‍යය අපේක්ෂාවෙන්
- සෙත් ශාන්තිය අපේක්ෂාවෙන්
- රෝග නිවාරණය සඳහා
- අපල උපද්‍රව දුරු කරගැනීම සඳහා

***මින් අරමුණු 2ක් නම් කර ඇත්නම් (ලකුණු 02යි)***

(ii)
- ඌරා යක්කම
- නයා යක්කම
- වැදි යක්කම
- දර්පණ යක්කම
- සීතා යක්කම
- ගුරුගේ මාලාව
- ගබඩා කොල්ලය

***මෙකී අවස්ථා හතරක් නම් කිරීම සඳහා*** ***(ලකුණු 04යි)***

(iii)
- බෙරකරු හා යක්දෙස්සා අතර කෙරෙන සංවාදය
- ගද්‍ය හා පද්‍ය ස්වරූපයෙන් ඉදිරිපත් කෙරෙන සංවාද
- මුබරි සංවාද භාවිතය
- සිංහල වචන වැරදි ආකාරයට උච්චාරණය කිරීම
- හාස්‍ය උපදවන ආකාරයට සංවාද භාවිතය

***වැනි කරුණු 02ක් නිදසුන් සහිත ව පැහැදිලි කර ඇත්නම්*** ***(ලකුණු 06යි)***

**4.** (i) රංග අභ්‍යාස යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)
(ii) රංග අභ්‍යාස **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) ඔබ නම් කරන රංග අභ්‍යාස මගින් රූපණ කාර්යයේ දී නළුවකුට ලැබෙන ප්‍රයෝජන මොනවා දැයි විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i) රංග අභ්‍යාස යනු රූපණ කාර්යය සාර්ථකකර ගැනීම සඳහා ශාරීරික හා මානසික හැකියාවන් දක්ෂතාවන් වර්ධනය කරගැනීමට උපකාර වන අභ්‍යාස විශේෂයකි.
***(ලකුණු 02යි)***

(ii) රංග අභ්‍යාස වර්ග
- සිරුර උණුසුම් කරන අභ්‍යාස
- ශ්වසන අභ්‍යාස
- සංවේදන අභ්‍යාස
- ශිථිලකරණ අභ්‍යාස
- කටහඬ අභ්‍යාස
- චලන අභ්‍යාස
- චිත්ත ඒකාග්‍රතාව ඇති කරන අභ්‍යාස
- රංග ක්‍රීඩා

ඉහත සඳහන් රංග අභ්‍යාස හතරක් නම් කිරීම සඳහා ***(ලකුණු 04යි)***

(iii) රංග අභ්‍යාස මගින් නළුවකුට ලැබෙන ප්‍රයෝජන
- ශරීරය සහ මනස සැහැල්ලු කරගත හැකි වීම.
- මානසික ඒකාග්‍රතාව ඇති කරගත හැකි වීම.
- රංගන කුසලතා දියුණු කරගත හැකි වීම.
- පරිකල්පනය වර්ධනය කරගත හැකි වීම.
- නිරවුල්ව හා මනාව කටහඬ ප්‍රක්ෂේපණය කිරීමට හැකියාව ලැබීම.
- හැඟීම් හා අදහස් නිරූපණයට අදාළ වන අයුරින් ඒ ඒ ඉන්ද්‍රියයන් ක්‍රියාත්මක කරවීමේ හැකියාව ලැබීම.
- සබකෝලය දුරු කරගැනීමට උපකාරී වීම.
- සාමූහික ව කටයුතු කිරීමට පුහුණුවක් ලැබීම.
- විනය හා ශික්ෂණය ඇති වීම.

**මෙවැනි කරුණු තුනක් විස්තර කිරීම සඳහා (ලකුණු 06යි)**

Department of Examinations - Sri Lanka

5. (i) වේෂභූෂණ යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)
(ii) වේෂභූෂණ මගින් නාට්‍යයකට ලැබෙන ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) වේෂභූෂණ නිර්මාණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු මොනවා දැයි විමසන්න. (ලකුණු 06 යි)

(i) වේෂභූෂණ යනු චරිත නිරූපණය සඳහා නළුනිළියන් අඳින වස්ත්‍ර හා පළඳින ආභරණ ඔටුණු ආදියයි.

**(ලකුණු 02යි)**

(ii) වේෂභූෂණ මගින් නාට්‍යයකට ලැබෙන ප්‍රයෝජන

- නාට්‍යයේ ශෛලිය හා සම්ප්‍රදාය කුමක් ද යි හඳුනාගැනීමට උපකාර වීම.
- චරිතවල බාහිර ස්වරූපය වයස තරාතිරම ගතිලක්ෂණ චරිත ලක්ෂණ ඉස්මතු කර පෙන්වීමට.
- රූපණ ශිල්පීන් ගේ බාහිර සහ අභ්‍යන්තර සමාරෝපයට උපකාරී වීම.
- නාට්‍යයේ කතා පුවතට අදාළ යුගය, දේශය, පරිසරය කාල වකවානුව යනාදිය හැඟවීමට.
- චරිතයක මානසික ස්වභාවය ඉස්මතු කිරීමට.
- නළුවා නිරූපණය කරන භූමිකාව පිළිබඳ දෘශ්‍ය සංඥා රැසක් වේෂභූෂණ මගින් අනාවරණය වීම.
- මනා ප්‍රේක්ෂාවක් මැවීමට උපකාරී වීම.
- නාට්‍යයේ සෞන්දර්යාත්මක ගුණය වර්ධනය කිරීමට ඉවහල් වීම.

වැනි ප්‍රයෝජන හතරක් සඳහන් කිරීම සඳහා

***(ලකුණු 04යි)***

(iii) වේෂභූෂණ නිර්මාණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු

- නාට්‍යයේ ශෛලිය සහ සම්ප්‍රදාය.
- නාට්‍යයෙන් නිරූපිත කාලය, දේශය, යුගය යනාදිය.
- නාට්‍යයේ චරිතවල ස්වභාවය.
- නාට්‍යයෙන් ඉස්මතු කෙරෙන අර්ථකථනය / තේමාව.
- චරිතවල මනෝභාව ගති ලක්ෂණ.
- රංග කාර්යයට බාධාවක් නොවීම.
- වර්ණ ගැළපීම / වර්ණ සංයෝජනය.
- යොදාගන්නා අමුද්‍රව්‍යවල ගුණාත්මක තත්ත්වය, කල් පවතින බව, වැය වන මුදල.

මෙවැනි කරුණු තුනක් නිදසුන් සහිත ව විමසා ඇත්නම්

***(ලකුණු 06යි)***

Department of Examinations - Sri Lanka

**6.** (i) නාට්‍ය අධ්‍යක්ෂණය අළලා සුගතපාල ද සිල්වා විසින් ලියන ලද ග්‍රන්ථයේ නම කුමක් ද? (ලකුණු 02 යි)
(ii) සුගතපාල ද සිල්වා රචනා කොට අධ්‍යක්ෂණය කළ ස්වතන්ත්‍ර නාට්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) සිංහල නාට්‍ය කලාවේ දියුණුවට සුගතපාල ද සිල්වා ගෙන් සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

(i) සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක

***(ලකුණු 02යි)***

(ii)
- බෝඩිංකාරයෝ (1962)
- තට්ටුගෙවල් (1964)
- නිල් කට්රොල් මල් (1967)
- දුන්න දූනුගමුවේ (1972)
- නන්දිවිසාල (1977)
- දැවැද්දෝ (1979)
- සත සහ සත (1980)
- සාන්තුවර සෙබලාණෝ (1991)

ඉහත සඳහන් නාට්‍ය 4ක් නම් කිරීමට

***(ලකුණු 04යි)***

(iii) සිංහල නාට්‍ය කලාවේ දියුණුවට සුගතපාල ද සිල්වා ගෙන් සිදු වූ සේවය
- ස්වතන්ත්‍ර නාට්‍ය කෘති 9ක් පමණ රචනා කිරීම
- විදේශීය නාට්‍ය කෘති 8 ක් පමණ අනුවර්තනය හෝ පරිවර්තනය කිරීම
- ස්වතන්ත්‍ර/ අනුවර්තන/ පරිවර්තන නාට්‍ය 15 ක් පමණ විවිධ තේමා හා රංග ශෛලීන් අනුව නිෂ්පාදනය කිරීම
- 1960 දශකයේ සිට ලෝකධර්මී නාට්‍ය නිෂ්පාදනයේ ප්‍රමුඛයකු ලෙස කටයුතු කිරීම
- බෝඩිංකාරයෝ, තට්ටු ගෙවල්, දුන්න දූනුගමුවේ, මරාසාද් වැනි සම්මානයට පාත්‍ර වූ උසස් ගණයේ නාට්‍ය නිෂ්පාදනය කිරීම
- නාට්‍ය නිෂ්පාදනය අළලා සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක නැමති කෘතිය රචනා කිරීම
- ගුවන් විදුලි නාට්‍ය රචනා කිරීම හා නිෂ්පාදනය කිරීම
- ජාතික තරුණ සේවා සභාව සංවිධානය කළ යෞවන නාට්‍ය උළලේ ආරම්භයේ සිට ම එහි සමායෝජක හා නාට්‍ය තරග විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම
- සමකාලීන සමාජ ප්‍රශ්න හා ජීවන ගැටලු සාකච්ඡා කිරීමට තාත්ත්වික සංවාද නාට්‍ය රීතිය අනුගමනය කිරීම
- නාට්‍ය නිෂ්පාදනයට සම්බන්ධ නව රංග උපක්‍රම වේදිකාවට හඳුන්වාදීම
- ප්‍රේමා ගනේගොඩ, ටෝනි රණසිංහ, වික්‍රම බෝගොඩ, ජී.ඩබ්. සුරේන්ද්‍ර වැනි දක්ෂ නළුනිළි පිරිසක් හඳුන්වාදීම

**මෙවැනි කරුණු 4ක් සඳහන් කොට ඇත්නම් ලකුණු 06යි.**

Department of Examinations - Sri Lanka

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.

ඉගෙනීමට දක්ෂ බුද්ධිකා සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වන ශිෂ්‍යාවකි. ඇගේ මල්ලි ඉගෙනීමට වඩා මිතුරන් සමඟ දවස පුරා සෙල්ලම් කිරීමට කැමති දඟකාර ළමයෙකි. කොවිඩ් වසංගතය නිසා සියලු පාසල් වසා ඇමුණු බව රූපවාහිනී ප්‍රවෘත්ති මගින් බුද්ධිකා ගේ මව දැනගනී. තම කාර්යාලයේ සේවකයකු කොවිඩ් පොසිටිව් වීම නිසා නිරෝධායනයට ගෙනයන ලද බව පියා දුරකථනය මගින් දැනුම් දෙයි.

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

දෙන ලද කථා සාරාංශය ඇසුරු කරගෙන

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා

***ලකුණු 04යි.***

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා

***ලකුණු 04යි.***

(iii) නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා

***ලකුණු 04යි.***

Department of Examinations - Sri Lanka